# Crime & Criminology



# What is Crime ?

- නෛතික නිර්වචනය

- මානුෂික අයිතිවාසිකම් අදාළව  කරනු  කරනු ලබන නිර්වචන

- සමාජ ක්‍රියාවලියට අදාළව  කරනු ලබන  නිර්වචන

# What is Crime – The Legal Pespective

- අපරාධ නීතිය යටතේ දඬුවම් ලැබෙන අනර්ථකාරී ක්‍රියාවක් ලෙස පෙන්වා දිය හැකියි
- Kenny ප්‍රකාශ කරන්නේ ඔහුගේ සංක්ෂිප්ත අපරාධ නීතිය (Outlines of the Criminal Law) කෘතිය මගින් අපරාධ පිළිබඳ නෛතික නිර්වචනයක් ගොඩනැගීම එතරම් පහසු නොවන බවයි

## P.W. Tappen

- American Sociological Review සඳහන් කරන්නේ සමාවක් දිය නොහැකි අපරාධ නීතිය හිතාමතා උල්ලංඝනය කිරීම සහ ඒ සඳහා රජයෙන් දඬුවම් පැමිණවීම (උල්ලංඝනයට එරෙහිව) අපරාධයකි

## E.H. Sutherland (White Collar Crime)

අපරාධයක අත්‍යාවශ්‍ය අංගයක් වන්නේ රජයට පීඩාවක් නිසාවෙන් රජය මගින් තහනම් කරන ලද හැසිරීමක් වීම සහ අන්තිමේ දී අවසාන ක්‍රියාමාර්ගයක් ලෙස එයට එරෙහිව දණ්ඩණය ලබා දීමයි

# Board of Trade Union v. Owen
# වෙළඳ සංගම් මණ්ඩලයට එ.ඕවන්

- අපරාධයක් යනු මහජනයාට එරෙහිව කරනු ලබන වරදක් වූ යම් නීතිවිරෝධී ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් වන අතර එකී ක්‍රියාවට වරදකරු වූ තැනැත්තා දඬුවමකට යටත්විය යුතුය

# අපරාධය යනු

- ක්‍රියාවම හෝ එහි ප්‍රතිඵලය හෝ හානි කර වූ සහ එය රජය විසින් ඉවත් කිරීමට අදහස් කරන්නා වූ ද ක්‍රියාව කරනු ලැබූ අයගේ වගකීමේ ස්වභාවය ප්‍රමාණය සහ නෛතික ප්‍රතිඵලය විමසා බැලීම සඳහා සාමාන්‍යයෙන් රජය වෙනුවෙන් ආරම්භ කරනු ලබන නඩු කටයුත්තක් හේතුවෙන් ක්‍රියාවට වගකිව යුතු තැනැත්තා යම් ආකාරයක දඬුවමකට යටත් කරන්නා වූ ද මිනිස් හැසිරීමක ප්‍රතිඵලයක් වූ යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමකි.

# The Human Rights Perspective

- ඕනෑම මූලික අයිතිවාසිකමක් උල්ලංඝනය කරනු ලැබීම අපරාධයක් ලෙස සැලකිය යුතු බව පෙන්වා දී ඇත
- අන් අයට අයිතීන් ලබාදීම වළකන තැනැත්තා කරනු ලබන්නා අපරාධකරු වෙයි

# Sociological Perspective

- යම් හැසිරීමක් අපරාධ ලෙස නම් කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් යනුවෙනි
- සමාජය එම ක්‍රියාව අවලෝකනය කරන ආකාරය වැදගත් වෙයි
- එයට දක්වන ප්‍රතිචාරය වැදගත් වෙයි
- නීති නියෝජිතයින් කරන අර්ථ දැක්වීම වැදගත් වෙයි
- 

# Origin of the Criminology

- 1885 රපායෙල් ගරාපාලෝ
- (Raffaele Garofalo)
- Criminologia
- 1887 පෝල් ටොපිනාර්ඩ්
- (Paul Topinard)
- Criminologie

# Criminology defines

නීති සැකසීම, නීති ක්‍රියාත්මක කිරීම සහ නීතියට එරෙහිව දක්වන ප්‍රතිචාරයයි

(E.H. Sutherland)

**සිංහල විශ්වකෝෂය**

අපරාධ සහ අපරාධ හේතු අධ්‍යයනය කරන විද්‍යාවයි

අපරාධ විද්‍යාව යනු  අපරාධ එහි හේතු සහ එය වැළැක්වීම පිළිබඳ විද්‍යාත්මක ඥාන සම්භාරයයි.

එසේම අපරාධ විද්‍යාත්මක පර්යේෂණයන් කිරීම එම දත්තයන් විග්‍රහ කිරීම අනුකලනය කිරීම, සහ ප්‍රායෝගිකව සමාජයට අනුවර්තනය කිරීමයි.

# Richard Quinney

අපරාධ විද්‍යාවේ අරමුණ විය යුත්තේ අපරාධ පිළිබඳ නව තේරුම් ගැනීම ඇති කිරීමයි :

අපරාධකාරී චර්යාවන් පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනය කර අපරාධ පාලනය සහ නිවාරණයට ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධව හදාරනු ලබන විෂයය අපරාධ විද්‍යාවයි.

අපරාධ සමාජ සංසිද්ධියක් ලෙස සලකා අපරාධ හා අපරාධකාරී හැසිරීම් රටාවන් පිළිබඳව විද්‍යානුකූලව හැදෑරීමයි.

අපරාධ විද්‍යාව යන යෙදුම එක් අතකින් අපරාධ පිළිබඳ දැනුම් සම්භාරයකි.

# සමාජ සංසිද්ධියක් ලෙස සළකා අපරාධ පිළිබඳ අධ්‍යයනය කිරීම මඟින් ගොඩනගන ලබන විද්‍යාත්මක දැනුම් සම්බන්ධතාවයි

Donald Cressey & E.H. Sutherland

# Applied Criminology

ව්‍යවහාරික සමාජ විද්‍යාත්මක දැනුම යොදා ගනිමින් රැස්කර ගනු ලබන දැනුම පදනම් කර ගනිමින් අපරාධ පාලනය සහ නිවාරණය ඔස්සේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම උදෙසා වන ප්‍රතිපත්ති හා සැලසුම් සම්පාදනය.

# Main Scope of the Criminology

- අපරාධ සහ අපරාධකරුවන් (**Crimes & Criminals**)
- පුනරුත්ථාපනය සහ විශෝධනය (**Rehabilitation & Corrections** )
- අපරාධ වලට බලපාන හේතු (**Reasons for Crimes**)
- අපරාධ යුක්ති පද්ධතිය (**Criminal Justice System**)
- දණ්ඩනවේදය (**Penology**)
- අපරාධ වින්දිතයින් (**Crime Victims**)
- අපරාධ නීතියෙහි සංවර්ධනය (**Development of Criminal Law**)
- අපරාධ විමර්ශනය (**Criminal Investigation**)
- අපරාධ වර්ගීකරණය (**Crime Typology**)

# Sub Fields of Criminology

- හිංසිතවේදය (Victim ology)
- විවේචනාත්මක අපරාධවිද්‍යාව (Critical Criminology)
- කාන්තාවාදි අපරාධවිද්‍යාව (Feminist Criminology)
- මාක්ස්වාදි අපරාධවිද්‍යාව (Marxist Criminology) හෝ
- රැඩිකල්වාදි අපරාධවිද්‍යාව (Radical Criminology
- සන්සන්දනාත්මක අපරාධවිද්‍යාව (Comparative Criminology)
- දණ්ඩනවේදය (Penology)

# Comparative Criminology

- අපරාධ පිළිබඳ සන්සන්දනාත්මකව අධ්‍යයනය කිරීම මෙමගින් සිදු වෙයි. සන්සන්දනාත්මක ක්‍රම යොදා ගනිමින් අපරාධ පිළිබඳ සොයා බැලෙයි. සමාජ සමූහ දෙකක් හෝ සංස්කෘතින් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සන්සන්දනය කිරීම මෙමගින් අපේක්ෂා කරනු ලබයි.
- මේ අනුව සංස්කෘතින් අතර හෝ ජාතින් අතර අපරාධ සහ අපරාධ පාලනය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙමගින් සිදු වෙයි.

# Critical Criminology

- 1950 ගණන්වලදී යථානුභූතවාදි ගුරුකුලයට අනුව අපරාධ එක් සිද්ධියක් ගැන විග්‍රහ කළ නමුදු පසුව අපරාධ වඩාත් විවේචනාත්මක ක්‍රියාවලියක් ලෙස විග්‍රහ කිරීමත් සමග විවේචනාත්මක අපරාධ විද්‍යාව ආරම්භ විය

- අපරාධ දෙස විවේචනාත්මක විශ්ලේෂණයන් රැගෙන ඒම මෙම උප විෂයය ක්ෂේත්‍රයෙහි අරමුණයි.

# Victimology

- අපරාධ ගොදුරුවේදය, අපරාධ වින්දිතයින් සම්බන්ධ කර ගනිමින් ගොඩනැගුණු දැනුම් සම්භාරයයි.
- මෙය හිංසිතවේදය ලෙස ද හඳුන්වනු ලැබේ. මෙම විෂය ක්ෂේත්‍රය මගින් අපරාධ වින්දිතයින් පිළිබඳ න්‍යායයන් ගොඩ නගයි

- විශේෂයෙන් අපරාධ වින්දිතයින්ගේ මානසික ස්වභාවය පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කරනු කරන අතර වින්දිතයාගේ පෞරුෂ ලක්ෂණ, වින්දිතයා සහ අපරාධකරු අතර සම්බන්ධතාවය සොයා බැලීමට ද මෙම විෂයය මගින් උනන්දු වෙයි.
- අපරාධ වින්දිත වර්ගීකරණයන්, අන්තර් ක්‍රියාකාරීත්වයන් පිළිබඳවද මෙහිදී අධ්‍යයනය කරනු ලබයි.

# Radical Criminology/Marxist Criminology

- 1970 ගණන්වලදී මාක්ස්වාදී මූලධර්ම පදනම් කර ගෙන එංගලන්තයෙහි සහ ඇමෙරිකාවේ මෙම විෂයයන් සංවර්ධනය විය

- 1973 වසරේ දී **The New Criminology** යනුවෙන් ප්‍රකාශයට පත් වූ ග්‍රන්ථය මගින් මෙම විෂයය ප්‍රචලිත කෙරිනි. කාර්මික සමාජයෙහි කම්කරු බලවේගය පහළ පන්තියයි.

- මොවුන් පාලනය කරනු ලබන්නේ අපරාධ නීතිය සහ සහ එය ක්‍රියාත්මක කිරීම තුළිනි.

# Feminist Criminology

- අපරාධ විද්‍යාව මගින් විශේෂ අවධානය යොමු වුයේ පිරිමි අපරාධකරුවන් සහ ඔවුන් පිළිබඳ පර්යේෂණ ගැනයි. පුරුෂයින් පිළිබඳ අධ්‍යයන තොරතුරු දෙපාර්ශවයම පිළිබඳ තීරණය ගැනීමට, හැසිරීම් විග්‍රහ කිරීමට යොදා ගන්නා ලදී.

- ඒ නිසා 1960 සහ 1970 දශකයන්හිදී කාන්තාවන් ද මෙම ක්ෂේත්‍රයට සම්බන්ධ කර ගන්නා ලෙස ඉල්ලා සිටීමේ ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රීවාදි අපරාධ විද්‍යාව සංවර්ධනය විය. මොවුහු ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ කාන්තා සාපරාධිත්වය පිළිබඳවද අවධානය යොමු කළහ.

- අපරාධ නිසා ලෝකයේ සෑම සමාජයකටම අත්විදීමට සිදු වන පිරිවැය අංශ තුනක් යටතේ පෙන්වා දිය හැකියි. එනම්
- පුද්ගල පිරිවැය **(Individual Cost)**
- සමාජ පිරිවැය **(Social Cost)**
- ආර්ථික පිරිවැයයි **(Economic Cost)**

# Thanks

Dr Anusha Edirisinghe
Senior Lecturer in Criminology
Dept. of Sociology
Faculty of Social Sciences
University of Kelaniya
0703 317417/ 0714463981
anusha_edirisinghe@yahoo.com